# ආර්ථික විද්‍යාව

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 07. මුදල් හා මිල මට්ටම්වල හැසිරීම

### බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනාගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායකවන ආකාරය

1) මුදලේ කාර්යයක් ලෙස සැලකෙන්නේ,
   (1) පොදු පිළිගැනීමක් පැවතීමය.
   (2) පහසුවෙන් එහා මෙහා ගෙනයා හැකි වීමය.
   (3) කුඩා කොටස්වලට බෙදිය හැකි වීමය.
   (4) වටිනාකම රැස්කිරීමේ මාධ්‍යක් ලෙස කටයුතු කිරීමය.
   (5) වටිනාකම ස්ථාවරව පවත්වා ගැනීමය.

2) වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියාකරන නමුත් හුවමාරු මාධ්‍යක් ලෙස ක්‍රියා නොකරන, ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු වත්කම් හඳුන්වන්නේ,
   (1) මුදල් ආදේශක වශයෙනි.
   (2) ආසන්න මුදල් වශයෙනි.
   (3) විද්‍යුත් මුදල් වශයෙනි.
   (4) හරපත් වශයෙනි.
   (5) ණයපත් වශයෙනි.

3) පදනම් මුදල්හි සංරචකයක් නොවන්නේ,
   (1) මහජනයා සතු ව්‍යවහාර මුදල්
   (2) වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
   (3) වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු
   (4) රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු
   (5) රජය විදේශ ණය ලෙස ලබා ගත් මුදල් ශේෂ

4) එක්තරා ආර්ථිකයක පටු මුදල් සැපයුම රු.බිලි.500ක් වන අතර පදනම් මුදල් රු.බිලි.100ක් වේ. වාණිජ බැංකුවල ඇති කාලීන තැන්පතු රු.බිලි.20ක් වන අතර අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු රු.බිලි.10කි. පුළුල් මුදල් ගුණකයෙහි අගය වන්නේ,
   (1) 5කි.
   (2) 5.3කි.
   (3) 1.92කි.
   (4) 5.2කි.
   (5) 0.18කි.

5) උද්ධමන අනුපාතිකයෙහි අගය ක්‍රමයෙන් අඩුවීමක් හඳුන්වන්නේ,

(1) උද්ධමනය ලෙසිනි.
(2) අවධමනය ලෙසිනි.
(3) නිරුද්ධමනය ලෙසිනි.
(4) පොදු මිල මට්ටම අඩුවීමක් ලෙසිනි.
(5) ප්‍රසර්පන උද්ධමනය ලෙසිනි.

6) මහ බැංකුව විවෘත වෙළෙඳපොළෙන් සුරැකුම්පත් මිලදී ගත හොත් ඇති විය හැකි ප්‍රතිවිපාක වන්නේ,

(1) මුදල් සැපයුම අඩුවීම.
(2) මුදල් සැපයුම ප්‍රසාරණය වීම.
(3) වාණිජ බැංකු සංචිත අඩු වීම.
(4) මහ බැංකුවේ වගකීම් අඩු වීම.
(5) වාණිජ බැංකු ණය දීම් අඩු වීම.

7) මුදල් ප්‍රමාණවාදී විග්‍රහයට අනුව, නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සරල විනිමය සමීකරණයක් පදනම් කරගෙන මුදල් ඉල්ලුම පිළිබඳව ඉදිරිපත් කර ඇත.
(2) සමාහාර ආදායම හා වියදම් විශ්ලේෂණය වැදගත් වේ.
(3) මුදලේ සංසරණ ප්‍රවේගය ස්ථාවර වන අතර ගනුදෙනු පරිමාව පමණක් වෙනස් වේ.
(4) මුදල් තොගය වෙනස් වීමත්, මිල මට්ටම වෙනස් වීමත් අතර ඍජු හා සමානුපාතික සම්බන්ධයක් ඇත.
(5) ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති සමතුලිතය කරා ළඟා වීමෙන් පසු තවදුරටත් ඉල්ලුම වැඩි වුවහොත් මිල මට්ටම ඉහළ යයි.

8) ආර්ථිකයක නාමික පොළී අනුපාතය 18%ක් වන අතර, උද්ධමන අනුපාතය 36%කි. මූර්ත පොළී අනුපාතය වන්නේ,

(1) 2% කි.
(2) 0.5% කි.
(3) 18% කි.
(4) -18% කි.
(5) 6.48% කි.

9) වෙළෙඳපොළේ මිල ගණන්වල සිදුවන විචලනයන් මැන බැලෙන නව දර්ශකය වන්නේ,

(1) තොග අලෙවි මිල දර්ශකයයි.
(2) නිෂ්පාදකයාගේ මිල දර්ශකයයි.
(3) ජාතික පාරිභෝගික මිල දර්ශකයයි.
(4) ගම්‍ය මිල දර්ශකයයි.
(5) කොළඹ පාරිභෝගික මිල දර්ශකයයි.

10) වාණිජ බැංකු පද්ධතිය තුළ ඇති ද්‍රවශීලතා ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා මහ බැංකුව යොදා ගනු ලබන්නේ,

(1) නිත්‍ය තැන්පතු පහසුකම් වේ.
(2) නිත්‍ය ණය පහසුකම් වේ.
(3) විවෘත වෙළෙඳපොළ කටයුතු වේ.
(4) වරණාත්මක පොළී අනුපාතය වේ.
(5) බැංකු තැන්පතු අනුපාතික වේ.

11) එක්තරා ආර්ථිකයක මුදල් සැපයුම 12 ක්ද, සංසරණ ප්‍රවේගය 10 ක්ද,ගනුදෙනු ප්‍රමාණය 08 ක්ද නම් මිල මට්ටම වන්නේ,

(1) 10
(2) 12
(3) 15
(4) 18
(5) 20

12) මහ බැංකුව විසින් තම ප්‍රතිපත්ති පොළී අනුපාතික ඉහළ දැමුවහොත්,

(1) මුදල් සඳහා ඉල්ලුම වැඩිවී පොළී අනුපාතික පහළ යයි.
(2) මුදල් සඳහා ඉල්ලුම වැඩිවී පොළී අනුපාතික ඉහළ යයි.
(3) මුදල් සඳහා ඉල්ලුම අඩුවී පොළී අනුපාතික පහළ යයි.
(4) මුදල් සැපයුම අඩු වී පොළී අනුපාතික ඉහළ යයි.
(5) මුදල් සැපයුම අඩු වී පොළී අනුපාතික පහළ යයි.

13) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය වන්නේ,

(1) මුදල් ඉලක්කකරණයයි.
(2) නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයයි.
(3) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයයි.
(4) පොළී අනුපාතික කොරිඩෝවයි.
(5) බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතයයි.

14) කිසියම් වාණිජ බැංකු පද්ධතියක රු. මිලියන 30 ක සංචිත ද රු.250 ක තැන්පතු ද පවතී. ව්‍යවස්ථාපිත සංචිත 10% ක් නම් උපරිම වශයෙන් බැංකු පද්ධතිය තව කොතරම් ප්‍රමාණයකින් මුදල් සැපයුම ප්‍රසාරණය කළ හැකිද?

(1) රු.මිලි. 2.5
(2) රු.මිලි. 5
(3) රු.මිලි. 50
(4) රු.මිලි. 55
(5) රු.මිලි. 60

15) වාණිජ බැංකු පද්ධතියක කල්පිත ශේෂ පත්‍රය පහත දැක්වේ.

| **වගකීම් රු. මිලි.** | | **වත්කම් රු.මිලි.** | |
|---|---|---|---|
| තැන්පතු | 100 | සංචිත | 20 |
| | | ණය | 80 |
| | 100 | | 100 |

මෙම බැංකු පද්ධතිය සතුව අධි සංචිත රු.මිලි.10ක් පවතී නම් ණය ලබා දිය හැකි මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන

(1) 10 කි.
(2) 20 කි.
(3) 50 කි.
(4) 80 කි.
(5) 100 කි.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

16) කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම රු.මිලි.6000 ක්ද බැංකු පද්ධතියේ මුළු තැන්පතු මිලි.4000 ද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ද නම් මුදල් ගුණකය වන්නේ,

(1) 2
(2) 2.5
(3) 3
(4) 3.5
(5) 4

17) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් වන වාණිජ බැංකුවක රු.මි.200 ක අධි සංචිත පවතී.මෙම බැංකු පද්ධතියේ මුදල් සැපයුම උපරිම වශයෙන් වැඩිකල හැක්කේ, පහත කවර රු.මිලි. ප්‍රමාණය දක්වාද?

(1) 800
(2) 1000
(3) 1200
(4) 1500
(5) 2000

18) එක්තරා ආර්ථිකයක නාමික දළ දේශීය නිෂ්පාදිතය රු.මි.10000 ක් ද පදනම් වර්ෂයේ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රු. මි. 8000ක් ද වේ නම් දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකයේ අගය වන්නේ,

(1) 50 කි.
(2) 100 කි.
(3) 125 කි.
(4) 150 කි.
(5) 175 කි.

19) නාමික පොළී අනුපාතය16% ක් ද ,මූර්ත පොලී අනුපාතය - 4% ක් ද නම් උද්ධමන අනුපාතය වන්නේ,

(1) 4%
(2) 8%
(3) 12%
(4) 20%
(5) 24%

20) අධි බලැති මුදල්වල ඇතුලත් මූලා වත්කම් අතරින් මුදල් සැපයුමේ ඇතුලත් වත්කම වන්නේ,

(1) වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු
(2) වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
(3) මහජනයා සතු ව්‍යවහාර මුදල්
(4) අනෙකුත් ආයතන මත බැංකුවේ පවත්වා ගෙනයන තැන්පතු
(5) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල්

# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 07. මුදල් හා මිල මට්ටම්වල හැසිරීම
### ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.
   (i) "මුදල්" අර්ථකථනය කර හොඳ මුදලක ලක්ෂණ 04ක් දක්වන්න.
   (ii) මුදලේ කාර්යයන් මොනවාද?
   (iii) වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම යන මුදලේ කාර්යය සාර්ථකව ඉටු කළ හැක්කේ කුමන තත්වයකදීදැයි පහදන්න.
   (iv) වර්තමානයේ භාවිතා වන මුදල් වර්ග මොනවාද?
   (v) ණයපත් හා හරපත් අතර වෙනස කුමක්ද?

2.
   (i) මුදලට ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු කවරේද?
   (ii) මුදලට ඇති ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක කවරේද?
   (iii) සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම රඳා පවතින්නේ කවර ප්‍රධාන සාධකය මතද? පහදන්න.
   (iv) සමපේක්ෂණ ක්‍රියාවේ යෙදෙන ජාවාරම්කරුවන් කවරේද?

3.
   (i) "මුදල් සැපයුම" අර්ථ දක්වා එම අර්ථකතන කාලයත් සමඟ වෙනස්වීමට බලපාන ප්‍රධාන සාධක 02 නම්කරන්න.
   (ii) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට ඇතුළත් සංරචක කවරේද?
   (iii) මුදල් සැපයුම තීරණය කරන සාධක මොනවාද?
   (iv) අධි බලැති මුදල් යනු මොනවාද? ඊට ඇතුළත් සංරචක මොනවාද?
   (v) මුදල් ගුණකය යනු කුමක්ද?

4.
   (i) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය යනු කුමක්ද? එය පැහැදිලි කරන න්‍යායන් නම් කරන්න.
   (ii) උද්ධමනය, අවධමනය සහ නිරුද්ධමනය නිර්වචනය කරන්න.
   (iii) උද්ධමනයේ පිරිවැයන් මොනවාද?
   (iv) උද්ධමනය පාලනය කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාද?
   (v) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම මැනීමට භාවිතා කරන මිල දර්ශක කවරේද?

5.
   (i) මූල්‍ය වෙළෙඳපොල හඳුන්වා එහි ප්‍රධාන අංශ දෙක දක්වන්න.
   (ii) මුදල් වෙළෙඳපොල උප වෙළෙඳපොලවල් නම් කරන්න.
   (iii) ණය ශ්‍රේණිගත කිරීම් යනු කුමක්ද?
   (iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු මොනවාද?
   (v) වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු මොනවාද?

6.

(i) මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක්ද?

(ii) ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ දෙක මොනවාද?

(iii) ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ 03ක් හා ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ 03ක් නම් කරන්න.

(iv) ආර්ථිකයේ මුදල් සැපයුම සීමා කරන සාධක මොනවාද?

(v) බැංකු පද්ධතියක සිටින එක් වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වගකීම් | ශේෂ පත්‍රය | | වත්කම් |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 6400 | සංචිත | 1280 |
| | | ණය | 5720 |
| | 6400 | | 6400 |

a) මෙම බැංකුව සතුව අධි සංචිත නොපවතී නම්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කීයද?

b) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 5%ක් නම්, මෙම බැංකුවට සැපයිය හැකි ණය කොපමණද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ගෙදර

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 07. මුදල් හා මිල මට්ටම්වල හැසිරීම
## ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේදී ගෙවීම් මාධ්‍යක් ලෙස පොදුවේ පිළිගන්නාවූ ඕනෑම දෙයක් මුදල් ලෙස හඳුන්වයි.

හොඳ මුදල් ඒකකයක ලක්ෂණ

- කල්පැවතීම
- සමජාතීය බව
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
- පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි වීම
- අනුකරණය කළ නොහැකි වීම

(ii)

- විනිමය මාධ්‍යක් වශයෙන් කටයුතු කිරීම
- වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම
- ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
- විලම්භිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම

(iii)අවදානමකින් හා අපහසුවකින් තොරව අනාගත අවශ්‍යතා සඳහා වටිනාකම රැස්කර තබා ගැනීම සඳහා මුදල් යොදා ගැනීම වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම යනුවෙන් හඳුන්වයි.

- භාණ්ඩවලින් වටිනාකම රැස් කිරීමේ දී පැන නගින ගබඩා කිරීමේ අපහසුව, නශ්‍ය වීම ආදී ගැටළු මෙහිදී පැන නොනගී.
- මුදල් පූර්ණ ප්‍රබලතාවකින් යුක්ත නිසා මුදලේ ක්‍රය ශක්තිය ස්ථාවර මට්ටමක පැවතීම, මුදලේ මෙම කාර්ය සාර්ථක කරනු ඇත.
- මිල මට්ටම සංවරව පවතින විටදී පමණක් මුදල් ඒකකවලින් අනාගතයේ කෙතරම් භාණ්ඩ ප්‍රමාණයක් මිලදී ගත හැකි දැයි දැනගත හැක.

(iv)

- ව්‍යවහාර මුදල්
- බැංකු මුදල්
- ආසන්න මුදල්
- මුදල් ආදේශක

- විද්‍යුත් මුදල්/ ඩිජිටල් මුදල්

v. යම් මූල්‍ය ආයතනයක් විසින් අනුමත වූ මුදල් සීමාවක් යටතේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත් අවශ්‍ය විටෙක මුදල් ලබා ගැනීමටත් අවසර ලබා දී නිකුත් කරන විද්‍යුත් කාඩ්පත ණය පතකි.

හරපත් යනු ගනුදෙනුකරුවන් මූල්‍ය ආයතනයක යම් මුදලක් තැන්පත් කළ විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින් ආපසු මුදල් ගැනීමට, වෙනත් ගිණුමකට මාරු කිරීමට භාවිතා කරන උපකරණයකි.

2.

(i)

- ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

(ii) ප්‍රධාන සාධකය පුද්ගලයන්ගේ ආදායමයි.

$M = f(y)$


අනෙකුත් කරුණු

- අනාගත මිල අපේක්ෂා
- මිල මට්ටම
- පොලී අනුපාතය
- මූල්‍ය ක්‍රමයේ නව්‍යතාවයන්
- ආයතනික සාධක

(iii)

- අනාගත පොලී අනුපාතිකයේ හට ගන්නා වෙනස්වීම් පිළිබඳව ඇති කරගන්නා අපේක්ෂාවන් මතයි.
- පොලී අනුපාතය හා පිලිනපත්වල මිල අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධයකි.
- පොලිය ඉහළ මට්ටමක පවතින විට අනාගතයේ පොලිය පහළ වැටේ යැයි සිතා මුදලට ඇති ඉල්ලුම කරයි.

පොලිය පහළ මට්ටමක පවතින විට අනාගතයේ එය ඉහළ යතැයි සිතා මුදලට ඇති ඉල්ලුම වැඩි කරයි.




- ඉහළ පොලී අනුපාතිකයක් පවතින විට මුදල් ශේෂ සඳහා ඉල්ලුම අඩු වීමට තවත් හේතුවක් නම්, මුදල් ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය වැඩිවීමයි.
- පොළිය ඉහළ මට්ටමක පවතින විට ආදායමක් නොලැබෙන මුදල් ශේෂ නිෂ්ක්‍රීයව ළඟ තබා ගැනීම අර්ථවත් නොවේ. එම නිසා මුදල් පොලී ආදායමක් ලබා ගත හැකි වත්කම්වල ආයෝජනය කිරීමට පෙළඹේ.

(iv)

- ❖ විකුණුම් නැඹුරු (Bears)

අනාගතයේ පිලිනපත් මිල අඩු වෙතැයි අපේක්ෂාවෙන් දැන් තමන් වෙත ඇති පිලිනපත් ලභි ලභියේ විකිණීමට කටයුතු කරන පිරිසයි.

- ❖ ගැනුම් නැඹුර

අනාගතයේ පිලනපත් මිල ඉහළ යතැයි සිතා දැන් අඩු මිලට වැඩිපුර පිලිණපත් මිලදීගැනීමට කඩිනම් වන පිරිසයි.

3.

(i)

- කිසියම් නිශ්චිත දිනකට එරට මහජනතාව සතු මුළු මුදල් තොගයේ වටිනාකමයි.නැතහොත් කිසියම් නිශ්චිත අවස්ථාවකදී මහජනතාව අත සංසරණය වන මුළු මුදල් තොගයයි.

වෙනස් වීමට හේතු

- රටක මූල්‍ය ව්‍යුහයේ ඇතිවන වෙනස්කම්
- මුදල් ලෙස සැලකිය යුතු පූර්ණ ද්‍රවශීලතාවයෙන් යුතු වත්කම්වල සිදුවන වෙනස්කම්

(ii) -මහජනයා සතු ව්‍යවහාර මුදල්

-මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු

-මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

-අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50%

-විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු

(iii) -බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්

- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්
- අනෙක් ශුද්ධ වත්කම්

(iv) අධිබලැති මුදල් යනු කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුව සතු ඍජු මූල්‍ය වගකීමයි. එහි සංරචක ,

- මහජනයා සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු
- රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු

(v) මුදල් ගුණකය යනු, ආර්ථිකයේ මුළු මුදල් සැපයුම හා පදනම් මුදල් අතර සම්බන්ධයයි.

$$K = \frac{M}{H}$$

4.

(i) සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹායන අතිවිශාල මුදල් ප්‍රමාණයක් නිසා මිල මට්ටම ඉහළ යාම ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය ලෙස හැඳින්වේ.

<u>න්‍යායන්</u>

- මුදල් ප්‍රමාණවාදය
- කේන්සියානු න්‍යාය

(ii) <u>උද්ධමනය</u> - දීර්ඝ කාලයක් තිස්සේ පටන් අඛණ්ඩව පොදු මිල මට්ටමේ හටගන්නා ඉහළයාමයි.

<u>අවධමනය</u> - දීර්ඝ කාලයක් තිස්සේ පටන් අඛණ්ඩව පොදු මිල මට්ටමේ සිදුවන පහළ වැටීමයි.

<u>නිරුද්ධමනය</u> - උද්ධමන අනුපාතිකයෙහි අගය ක්‍රමයෙන් අඩුවීමයි.

(iii) -ආදායම් හා ධන ව්‍යාප්තිය අයහපත් විම
-නිරපේක්ෂ දරිද්‍රතාව ඉහල යාම.
-ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීම
-ණයහිමියන්ට අවාසිදායක වීම
-ඉතිරි කරන්නන්ට අයහපත් වීම

(iv) -සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම
- සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම
- ඍජු රාජ්‍ය මැදිහත් විම
- කාර්යක්ෂම සම්පත් බෙදාහැරීමෙහිලා පවතින බාධක ඉවත් කිරීම

(v) -කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- ජාතික පාරිභෝගික මිල දර්ශකය
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය
- දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

5.

(i) කෙටිකාලීන හා දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සපුරාගැනීම සඳහා මූල්‍ය උපකරණ මිලට ගැනීම හා විකිණීම සිදුවන වෙළෙඳපොළයි.

- මුදල් වෙළෙඳපොළ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ

(ii) -අන්තර් බැංකු ඒක්ෂණ ණය මුදල් වෙළෙඳපොල
-භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල
-වාණිජ පත්‍රිකා වෙළෙඳපොල
-අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොල

(iii) ණය හෝ මූල්‍ය උපකරණ හෝ නිකුත් කරන්නාගේ මූල්‍ය ශක්තිය පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කිරීම ණය ශ්‍රේණිගත කිරීමයි. මෙමගින් නිකුත් කරන්නාට එම නිකුතුව පවත්වාගෙන යාමට

ඇති හැකියාව හා පරිණතවන කාලයට එය සම්පූර්ණයෙන්ම පියවා දැමීමට ඇති හැකියාව සොයා බැලේ.

(iv)

- ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගෙන යාම.
- මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වාගෙන යාම.

(v)

- මුදල් ඉලක්කකරණය
- නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය

6).

(i) ආර්ථිකයේ මිල ස්ථායීතාවත් මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවත් යන අරමුණු ඉටු කර ගැනීමට මුදල් සැපයුම හා පොලී අනුපාතිකයට බලපෑම් කිරීමට මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ මෙහෙයවීමයි.

(ii) ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ
ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ

(iii) <u>ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ</u>

- මහ බැංකු පොලී අනුපාතිකය
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
- විවෘත වෙළෙඳපොල කටයුතු

<u>ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ</u>

- ණය ශීර්ෂ පිළිබඳ උපරිම සීමා නියම කිරීම.
- යහ පෙළඹීම.
- වරණාත්මක පොලී අනුපාත නියම කිරීම.
- ඇප සුරැකුම් වෙනස් කිරීම.
- බැංකු ණය පාලනය

(iv)

- බැංකු පද්ධතිය වෙතින් බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් ගලා යාම
- ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීම සඳහා මහජනයා දක්වන අභිරුචිය
- අධි සංචිත තබා ගැනීමට වාණිජ බැංකු දක්වන කැමැත්ත
- බැංකු ණය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් ඇති නොවීම

(v)

a. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය $= \frac{\text{සංචිතය}}{\text{තැන්පතුව}} \times 100$

$= \frac{1280}{6400} \times 100$

$= 20\%$

b. අවශ්‍යා සංචිතය $= 6400 \times 5\%$

$= \underline{\underline{320}}$

මාණික හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | | |
|---|---|---|
| අධි සංචිතය | = | 1280 – 320 |
| | = | <u>960</u> |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."